# ජාතික රාජ්‍ය සභාවේ
# 1974 අංක 38 දරන අල්ලස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 24 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 නොවැම්බර් මස 08 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබා ගත හැකිය.

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන
අල්ලස් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ඔක්තෝබර් මස 24 වන දින]

එල්. ඩී.—ඔ. 30/72.

අල්ලස් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මෙ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 38 දරන අල්ලස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන අල්ලස් පනතේ 4 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 26 වන අධිකාරයේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (5) වෙනත් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, අල්ලස් කොමසාරිස්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා ලද යම් දිවුරා කළ ප්‍රකාශයක හෝ යම් ලේඛනයක සහතික පිට පතක්, මේ පනත යටතේ පවරනු ලැබූ යම් නඩුවක කාර්යයන් සඳහා සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර එසේ වූ සහතික පිටපතක් ඉදිරිපත් කිරීම එය ලියා අත්සන් කළ බවට සහ එහි අඩංගු කරුණු පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂ්‍යය වන්නේ ය.

(6) මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු විභාගයක් පවත්වා ගෙන යන අතරතුර, (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ ඉදිරිපත් කරන ලද හෝ සපයන ලද යම් ලේඛනයක් හෝ එහි සහතික පිටපතක් ලියා අත්සන් කිරීම හෝ එහි අඩංගු කරුණු තහවුරු කිරීම පිණිස යම් සාක්ෂිකරුවකු කැඳවිය යුතු යයි නඩු විභාග කරන විනිශ්චයකාරවරයා හෝ නඩුවේ දෙපාර්ශ්වයෙන් යම් පාර්ශ්වයක් හෝ අදහස් කරන්නේ නම් පැමිණිලි පක්ෂයේ වෙනත් යම් සාක්ෂි කරුවකු කැඳවන්නාක් මෙන් ම ඒ සාක්ෂිකරු සාක්ෂි දීම සඳහා අධිකරණය විසින් කැඳවිය යුතු ය. ".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (2) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතෙහි 250 වන වගන්තිය හා 238 (2) වන වගන්තිය (1) වන උප වගන්තියෙහි සඳහන් නඩු කටයුතුවලට අදාළ නොවන්නේ ය. ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" සෝදිසි වරෙන්තුවක් පිට යාත්‍රයක්, භූමියක් යනාදිය සෝදිසි කිරීම.

7. මහේස්ත්‍රාත්වරයකුගෙන් සෝදිසි වරෙන්තුවක් ලබා ගැනීමෙන් පසුව, මේ පනත යටතේ කරනු ලබන යම් විමර්ශනයක දී හෝ මේ පනතේ කාර්යයන් අතුරින් යම් කාර්යයක් සඳහා හෝ එම වරෙන්තුවෙහි සඳහන් යම් ස්ථානයකට, ගොඩනැගිල්ලකට, නිවාසයකට හෝ

2—ඒ 09448—12,080(74/09)

වෙනත් භූමියකට ඇතුළු වී විමර්ශනයේ කාර්යයන් සඳහා අවශ්‍ය යයි සලකනු ලබන යම් පොතක්, ලේඛන යක් හෝ දෙයක් තම භාරයට ගැනීම, හෝ එම භූමිය හෝ එහි ඇති යම් දේපළක් තක්සේරු කිරීමේ කාර්යය සඳහා එම භූමියට ඇතුළුවීම හෝ එය පරීක්ෂා කිරීම අල්ලස් කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් 3 වන වගන්තිය යටතේ බලය පවරන ලද හෝ ඔහුගේ පාලනය යටතේ ක්‍රියා කරන තැනැත්තකු විසින් හෝ කළ හැකි ය ; තව ද ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 95 වන වගන්තියෙ හි සිට 99 වන වගන්තිය (දෙකම ඇතුළුව) දක්වා වූ වගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව එවැනි යම් සෝදිසි වරෙන්තුවක් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් :—

" (2) වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ 23අ වන වගන්තිය යටතේ වූ වරදක් පිළිබඳ අල්ලස් අධිචෝදනාවක් විභාග කිරීමේ අධිකරණ බලය යම් දිසා අධිකරණයකට ඇත්තේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

" (1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 44 දරන යුක්තිය පසිඳලීමේ පනතේ 178 වන වගන්තියෙන් නියමිත ආකාරයට පිළියෙල කරන ලද අධිචෝදනා පත්‍රයක් නඩු විභාගය සඳහා නීතිපතිවරයා විසින් යම් දිසා අධිකරණයකට යැවිය යුතු ය. අධිචෝදනා පත්‍රය මත නඩු විභාග කරනු ලැබීමට භාජනය වන චූදිතයාට හෝ එක් එක් චූදිතයාට හෝ භාරදෙනු ලැබීම පිණිස අධිචෝදනා පත්‍රයේ පිටපතක් හෝ පිටපත් හෝ නඩුව විභාග කරන අධිකරණය වෙත ඒ අවස්ථාවේදීම ඔහු විසින් යැවිය යුතුය. නඩුව විභාග කරන අධිකරණයේ විනිශ්චයකාරවරයා විසින් නීතිපතිවරයාගෙන් තමා වෙත ලැබුණු අධිචෝදනා පත්‍රයේ පිටපත හෝ පිටපතක් නොපමාව සහ නඩුව විභාග කිරීමට නියමිත දිනයට යටත් පිරිසෙයින් දින දහහතරකටවත් කලින් චූදිතයා හෝ එක් එක් චූදිතයා වෙත භාරදිය යුතු ය; නැතහොත් භාරදීමට සැලැස්විය යුතු ය.".

7. 1958 අංක 40 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය, පහත සඳහන් පරිදි තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

" (3) මේ පනත යටතේ වරදක් සම්බන්ධයෙන් නඩු විභාගයක් පවත්වාගෙන යන අතරතුර මේ පනත යටතේ ඒ වරද සම්බන්ධයෙන් පවත්වනු ලැබූ යම් විමර්ශනයක දී යම් සාක්ෂිකරුවකු ඔහු විසින් කලින් කරනු ලැබූ යම් ප්‍රකාශයක් එහි වූ යම් වැදගත් කරුණක් සම්බන්ධයෙන් ප්‍රකාශිතව ම හෝ අවශ්‍ය ව්‍යංගයෙන් ප්‍රතිෂේධ කරතහොත්, යෙදී ඇති සියලු කරුණු අනුව ආරක්ෂා සහිත යයි ද සාධාරණ යයි ද නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා සලකන්නේ නම් එම විනිශ්චයකාරවරයා විසින්—

(අ) ඒ සාක්ෂිකරු විසින් විමර්ශනයේ දී කරන ලද ප්‍රකාශය, එහි වැදගත් කරුණු සම්බන්ධයෙන් ස්වාධීන ප්‍රභවය කින් ලැබුණු සාක්ෂිවලින් තහවුරු වන්නේ නම් ඒ ප්‍රකාශය අනුව ක්‍රියා කිරීම ; සහ

(ආ) ඒ නඩු විභාගය අවසාන වූ පසු, අධිකරණ කෘත්‍යයක යම් අවධියක දී සිතාමතා බොරු සාක්ෂි දීම පිළිබඳව එම අධිකරණයේ ලේකම් විසින් පිළියෙල කොට අත්සන් කරන ලද අධිචෝදනා පත්‍රයක් මත එම සාක්ෂිකරු විනිශ්චය සඳහා ඉදිරිපත් කරවා නඩු විභාග කිරීම ද

නීත්‍යානුකූල වන්නේ ය. " ; තවද

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් :—

" (4) චූදිතයා විසින් කරන ලදැයි අධිචෝදනා පත්‍රයෙහි දැක්වෙන ප්‍රතිෂේධී ප්‍රකාශ චූදිතයා විසින් කරන ලදැයි ඔප්පු කිරීම, (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ පැවැත්වෙන නඩු විභාගයක දී ප්‍රමාණවත් වන අතර අසත්‍ය ප්‍රකාශය ඒ ප්‍රකාශවලින් කවරක් ද යන්න ඔප්පු කිරීම අවශ්‍ය නොවන්නේ ය.

(5) නඩුව විභාග කරන විනිශ්චයකාරවරයා අවස්ථානුකූල යයි සලකන්නේ නම් (3) වන උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ යම් සාක්ෂිකරුවකු පිළිබඳව පැවැත්වෙන නඩු විභාග යක්, තමා සුදුසු යයි සිතන කාලයක් සඳහා කල් තැබිය හැකි අතර එවැනි යම් අවස්ථාවක දී ඒ නඩු විභාගය අවසාන වන තෙක් චූදිතයා සිර අඩස්සියේ තැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම.

8. 1958 අංක 40 දරන පනතින් හා 1965 අංක 2 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියේ (ඇ) ඡේදය වෙනුවට පහත සඳහන් ඡේදය ආදේශ කිරීමෙන් :—

" (ඇ) රාජ්‍ය නිලධරයකු ව, යම් තුටු පඬුරක් අයදින හෝ භාර ගන්නා, " ;

(2) එම වගන්තියේ අවසානයේ ඇති නැවතීමේ තිත වෙනුවට දෙතිතක් ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ අගට පහත සඳහන් අතුරු වගන්තිය එකතු කිරීමෙන් :—

" එසේ වුව ද, නීතිය හෝ තම රක්ෂාවේ කොන්දේසි අනුව ලබා ගැනීමට තමාට බලය පැවරී ඇති යම් තුටු පඬුරක් රාජ්‍ය නිලධරයකු විසින් අයැදීම හෝ භාරගැනීම වරදක් නොවන්නේ ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වන වගන්තිය සංශෝධනය කිරීම.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ (1958 අංක 40 දරන පනතින් ඇතුළත් කරන ලද) 23අ වන වගන්තිය, එම වගන්තියේ අගට පහත සඳහන් අලුත් උප වගන්ති එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

' (5) යම් තැනැත්තකුගේ භාර්යාව හෝ ස්වාමිපුරුෂයා හෝ වයස අවුරුදු දහ අටට අඩු අවිවාහක දරුවකු විසින් 1954 මාර්තු මස 1 වන දින හෝ ඉන් පසු යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගෙන ඇති අවස්ථාවක එම දේපළ අත්කර ගන්නා ලද්දේ අවස්ථාවෝචිත පරිදි එම භාර්යාව හෝ ස්වාමිපුරුෂයා හෝ අවිවාහක දරුවා විසින් නොව ඒ තැනැත්තා විසින් යැයි, ඊට පටහැනිව කරුණු ඔප්පු කරන තුරු මේ වගන්තියේ කාර්යයන් සඳහා පූර්ව නිගමනය කළ යුතු ය.

(6) මේ වගන්තිය යටතේ වරදක් සම්බන්ධයෙන් වූ යම් නඩු පැවරීමක දී යම් නිශ්චල දේපළක වටිනාකම සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරු විසින් දෙනු ලබන සහතිකයක්, ඊට පටහැනිව කරුණු ඔප්පු කරනු ලැබුවහොත් මිස හා ඔප්පු කරනු ලබන තෙක්, ඒ නිශ්චල දේපළේ වටිනාකම පිළිබඳ ප්‍රමාණවත් සාක්ෂ්‍යය විය යුතු ය.

මේ උපවගන්තියේ " ප්‍රධාන තක්සේරුකරු " යන්නෙන් ආණ්ඩුවේ ප්‍රධාන තක්සේරුකරු අදහස් වන අතර, ආණ්ඩුවේ තක්සේරු දෙපාර්තමේන්තුවේ යම් ජ්‍යෙෂ්ඨ සහකාර තක්සේරු කරුවෙක් හෝ සහකාර තක්සේරුකරුවෙක් ඊට ඇතුළත් වේ. '.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය, එම වගන්තියේ අගට පහත සඳහන් අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(3) මේ පනතේ මෙම කොටස යටතේ යම් වරදක් කිරීමට වෙනත් තැනැත්තකු සමග කුමන්ත්‍රණය කරන යම් තැනැත්තකු වරද කරුවකු වන අතර, පළමු සඳහන් වරදට මෙම පනතින් නියමිත ආකාර යට ම නඩු විභාගයකට භාජනය කරනු ලැබීමට හා වරදකරු කරනු ලැබූ විට පළමු සඳහන් වරදට මෙම පනතින් නියමිත දඬුවමට ම යටත් විය යුතුය. මෙම උපවගන්තියෙහි "කුමන්ත්‍රණය කිරීම" යන යෙදුම මෙහි, දණ්ඩ නීති සංග්‍රහයේ 113අ වන වගන්තියෙහි එම යෙදුමට දී ඇති අර්ථයම ඇත්තේ ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තියට ඉක්බිතිවම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 26අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— 26අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"අතිරේක දඩයක් නියම කළ යුතු බව.

26අ. දිසා අධිකරණය විසින් යම් තැනැත්තකු 23අ වන වගන්තිය යටතේ යම් වරදක් සම්බන්ධයෙන් වරද කරු කරනු ලැබූ අවස්ථාවක, මේ පනත යටතේ ඒ අධිකරණය විසින් නියම කළ යුතු යයි නියමිත දණ්ඩනය කට අතිරේකව, අල්ලස්වලින් හෝ අල්ලස්වලින් ලත් දෙයකින් අත්කර ගත් ප්‍රමාණය නැතහොත් අල්ලස් වලින් හෝ අල්ලස්වලින් ලත් දෙයකින් දේපළ බවට පරිවර්තනය කර ගෙන තිබෙන ප්‍රමාණය වශයෙන් එකී අධිකරණය විසින් තීරණය කරනු ලබන ප්‍රමාණයට අඩු නොවන්නා වූ ද එම ප්‍රමාණය මෙන් තුන් ගුණයකට වැඩි නොවන්නා වූ ද දඩයක් එම අධිකරණය විසින් ඔහුට නියම කළ යුතු ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 30අ වන වගන්තිය ලෙස බල පැවැත්විය යුතුය :— 30අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

"නීති විරෝධි තුටු පඬුරක් ලබා ගන්නා තැනැත්තකු අසු වූ විට ගතයුතු ක්‍රියා මාර්ගය.

30අ. (1) යම් නීති විරෝධි තුටු පඬුරක් භාර ගන්නා, අයැදින හෝ පිරිනමන යම් තැනැත්තකු අල්ලස් කොමසාරිස්වරයා විසින් 3 වන වගන්තිය යටතේ තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ යම් නිලධරයකුට අසු වූ අවස්ථාවක එකී නිලධරයා විසින්—

(අ) එම තැනැත්තා අනවශ්‍ය ප්‍රමාදයෙන් තොරව යම් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට ගෙන යා යුතු අතර ඒ මහේස්ත්‍රාත්වරයා විසින් එකී තැනැත්තාට ඇප දෙනු ලැබිය හැකි ය ; නැතහොත්

3—ඒ 09448 (74/09)

(ආ) එම තැනැත්තා නීති විරෝධී තුටු පඬුරක් භාර ගැනීමේ දී, අයැදීමේ දී හෝ පිරිනැමීමේ දී අල්ලා ගත් බවට අල්ලස් කොමසාරිස්වරයා විසින් අත්සන් කරන ලද සහතිකයක් සමඟ යම් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියට පැමිණවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ යම් තැනැත්තකු යම් මහේස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක, මහේස්ත්‍රාත්වරයා විසින් එම තැනැත්තා නඩු විභාගය නිම වන තුරු සිර අඩස්සියේ තැබිය යුතු අතර නීතිපතිවරයා විසින් ලියවිල්ලකින් දෙනු ලබන අනුමතය ඇතිව මිස ඒ තැනැත්තාට ඇප දෙනු නො ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදය හෝ (ආ) ඡේදය යටතේ යම් නඩු කටයුත්තක දී, අත්අඩංගුවේ සිටින තැනැත්තාට විරුද්ධව නඩු පැවරීමට තමා අදහස් නොකරන බව නීතිපතිවරයා මහේස්ත්‍රාත්වරයාට දන්වුවහොත්, (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් ව ඇත ද ඒ තැනැත්තා වහාම නිදහස් කරනු ලැබිය යුතු ය. ''.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම.

**13.** ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (4) වන සහ (5) වන උපවගන්ති ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

89අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

**14.** ප්‍රධාන ප්‍රඥප්තියේ 89 වන වගන්තියට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ඒ ප්‍රඥප්තියේ 89අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :—

'' රාජ්‍ය නිලධරයකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී තුටු පඬුරක් අයැදීම හෝ භාර ගැනීම.

89අ. යම් තුටු පඬුරක් අයැදීම හෝ භාරගැනීම මේ පනත යටතේ වරදක් වන විට ඒ තුටු පඬුර අයැදින හෝ භාර ගන්නා රාජ්‍ය නිලධරයකු ඒ අයැදීම හෝ භාරගැනීම ශ්‍රී ලංකාවෙන් පිටත දී කරන ලද නම් ඒ වරද ශ්‍රී ලංකාව තුළ දී කරන ලද සේ සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව, වෙනත් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, ඒ වරද පිළිබඳව නඩු විභාග කිරීමට කොළඹ දිසා අධිකරණයට අධිකරණ බලය ඇත්තේ ය. ''.